අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/12/07/19
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.10. 10

චක්‍රලේඛ අංක : **31/2025**

**සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්**
**සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**
**සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**
**සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**
**සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත**

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත 6 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම**

පාසල්වල 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධව උපදෙස් ඇතුළත් 2023.04.25 දිනැති අංක 17/2023 චක්‍රලේඛය, 2008.09.19 දිනැති අංක 2008/37 චක්‍රලේඛය, 2018.02.16 දිනැති අංක 03/2018 සහ 2019.06.26 දිනැති 33/2019 දරන චක්‍රලේඛ සංශෝධනයන්, ආදි ශිෂ්‍ය ගණය යටතේ ක්‍රියාකාරී ආදි ශිෂ්‍යයන් සඳහා නියමිත 2.5% තෝරා ගැනීම සම්බන්ධ 2018.12.19 දිනැති ED/01/12/15/02/04 අංක දරන උපදෙස් ලිපිය ඇතුළු ඒ සම්බන්ධව මෙයට පෙර නිකුත් කර ඇති සියලු ම චක්‍රලේඛ අවලංගු කර 2025.09.09 දින සිට ඉදිරියට මෙම චක්‍රලේඛයේ උපදෙස් පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත 6 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ දී බලපවත්වනු ඇත.

සියලු ම ජාතික පාසල්වල සහ කඩඉම් ලකුණක් තීරණය වන පළාත් පාසල්වල තම පාසලේ සිසුන් හා පෝෂිත පාසල්වලින් ඇතුළත් වන සිසුන්ට අමතර ව 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් පාසල්වල 6 ශ්‍රේණියට ඇතුළත් කිරීමට අනුමැතිය ලබා දීම මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව මගින් පමණක් සිදු කරනු ලබන බව අවධාරණය කරනු ලැබේ.

**2.0 හයවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා පුරප්පාඩු කැඳවීම**

2.1 6 ශ්‍රේණියේ පන්තියක සිටිය යුතු අනුමත උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45ක් වන අතර පාසලක යම් භෞතික සාධකයක් මත පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් පවත්වා ගෙන යා යුතු නම් (උදා. පන්ති කාමරයේ ප්‍රමාණය නියමිත පරිමාණයට නොමැති වීම) ඒ සඳහා එම තොරතුරු සනාථ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු ය. එහි පිටපත් මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කිරීමට ද කටයුතු කළ යුතු වේ.

2.2 ජාතික පාසලක් නම්, මෙම අමාත්‍යාංශ ව්‍යුහ කමිටුවේ ද පළාත් පාසලක් නම්, පළාත් ව්‍යුහ කමිටුවේ ද තීරණයක් නොමැති ව පන්ති/ සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නො කළ යුතු ය.

2.3 ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු තීරණය වන පාසල්වල විදුහල්පතිවරුන් විසින් තම පාසලේ 6 වන ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව සහ අනෙකුත් තොරතුරු ඇමුණුම 01හි සඳහන් ආකෘතිය අනුව සකස් කර සෑම වර්ෂයකම අගෝස්තු මස 01 වන දිනට පෙර මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කළ යුතු ය.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

2.4 පුරප්පාඩු කැඳවීම් කරනු ලබන අවස්ථාවන් හිදී තම පාසලේ පවතින පුරප්පාඩු නිවැරදිව ගණනය කර පාසල් කටයුතු ශාඛාව වෙත යොමු නො කිරීම හේතුවෙන් උද්ගත වන විගණන හෝ නීතිමය කටයුතු සඳහා විදුහල්පති සෘජු ව ම වගකිව යුතු ය.

**3.0 පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත හයවන ශ්‍රේණිය සඳහා අයදුම් කිරීම**

3.1 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල මත හයවන ශ්‍රේණිය සඳහා අයදුම් කිරීම සහ අභියාචනා ඉදිරිපත් කිරීම මාර්ගගත පද්ධතියක් මඟින් පමණක් සිදු කරනු ලැබේ. මාර්ගගත පද්ධතිය මඟින් අයදුම්පත් යොමු කළ යුතු කාල සීමාව, අයදුම් කළ හැකි පාසල් නාම ලේඛන සහ මාර්ගගතව පාසල් අයදුම් කිරීම සම්බන්ධ තාක්ෂණික උපදෙස් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සහ මාධ්‍ය මඟින් පළ කරනු ලබන අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම පාසල් කටයුතු ශාඛාව මඟින් සිදු කරනු ලැබේ.

3.2 මෙම උපදෙස් සම්බන්ධව තම කලාපයේ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වන අතර සියලු ම විදුහල්පතිවරුන් මෙම උපදෙස් අනුව කටයුතු කිරීම අනිවාර්ය බව තරයේ අවධාරණය කරනු ලැබේ.

3.3 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු නිකුත් කිරීමෙන් පසු දිස්ත්‍රික් කඩඉම් ලකුණ ඉක්මවූ සිසුන් ට පාසල් අයදුම් කිරීම සඳහා අයදුම්පත් පාසල මඟින් දෙමාපියන් වෙත ලබා දෙනු ලැබේ. එම අයදුම්පත් දෙමාපියන් මඟින් සම්පූර්ණ කරවා ගැනීමට විදුහල්පතිවරුන් කටයුතු කළ යුතු අතර අයදුම්පත් කැඳවීමේ කාල සීමාව තුළ පාසලේ විදුහල්පති විසින් එම තොරතුරු මාර්ගගත පද්ධතියට ඇතුළත් කළ යුතු වේ.

3.4 මාර්ගගත පද්ධතියට පාසල විසින් ඇතුළත් කරන ලද තොරතුරුවල මුද්‍රිත පිටපතක් ලබා දීමෙන් හෝ එම තොරතුරු පරිගණක තිරය මත දෙමාපියන්ට පරීක්ෂා කිරීමට ලබා දීමෙන් මාර්ගගත පද්ධතියට ඇතුළත් කරන ලද තොරතුරුවල නිවැරදිතාව පරීක්ෂා කිරීමට දෙමාපියන්ට අවස්ථාව ලබා දී ඒ බව දෙමාපියන්ගේ අත්සන ලබාගෙන සහතික කර ගත යුතු ය. මෙම අත්සන් ලේඛන විදුහල්පති විසින් පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය. මාර්ගගත පද්ධතියට තොරතුරු නිවැරදි ව ඇතුළත් කිරීමේ වගකීම අදාළ පාසලේ විදුහල්පතිවරයා සතු වේ.

3.5 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් සිසුන් ලබා ඇති ලකුණු, සිසුන් පාසල් ඉල්ලුම් කරන අනුපිළිවෙළ සහ අදාළ පාසල්වල පවතින පුරප්පාඩු මත පාසල් කඩඉම් ලකුණ තීරණය වේ. මෙහි දී සිංහල හා දෙමළ මාධ්‍ය සඳහා පමණක් වෙන වෙනම සිසුන් තෝරා ගනු ලැබේ. එසේ තීරණය වූ කඩඉම් ලකුණට අනුව පාසල් සඳහා තෝරා එවනු ලබන සියලු ම සිසුන් එම පාසල්වලට ඇතුළත් කර ගත යුතු වේ.

3.6 තම පාසල් වෙත යොමු කරන ලද ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව එම ශිෂ්‍යත්වධාරීන් අතරින් ඇතුළත් වූ සිසුන්, ඇතුළත් නො වූ සිසුන් හා තව දුරටත් පවතින පුරප්පාඩු පිළිබඳ සවිස්තර වාර්තාවක් සති දෙකක් තුළ පාසල් කටයුතු ශාඛාව වෙත ඉදිරිපත් කිරීමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු වේ.

3.7 ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් පාසල් සඳහා කඩඉම් ලකුණු නිකුත් වීමෙන් පසුව යම් සිසුවෙකුට තමාට ලැබී ඇති පාසල හැර වෙනත් පාසලකට අයදුම් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අභියාචනා මඟින් අවස්ථාව ලබා දෙනු ලැබේ. ඒ සඳහා සිසුන්ගේ දෙමාපියන්/ භාරකරුවන් විසින් අභියාචනා කැඳවන කාල සීමාව තුළ මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව

වෙත මාර්ගගත පද්ධතිය මගින් අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි ය. එලෙස අභියාචනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී සිසුන් අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන මාධ්‍ය සඳහන් කළ යුතු වේ. තැපැල් මඟින් හෝ අතින් භාර දෙන අභියාචනා සම්බන්ධව සලකා නො බලන අතර මේ සම්බන්ධ උපදෙස් අදාළ කාල සීමාව තුළ දී අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

3.8 අභියාචනා මගින් සිසුන්ට පාසල් ලබා දීමට හැකි වන්නේ ඉල්ලුම් කරන පාසලේ අදාළ මාධ්‍යය යටතේ පුරප්පාඩු ඇති වුවහොත් සහ සිසුවා ලබා ගත් ලකුණු එම පාසලට තීරණය වී ඇති කඩඉම් ලකුණට වැඩි හෝ සමාන වුවහොත් පමණි. එහෙත් පාසලේ පුරප්පාඩු තිබිය දී පාසලේ කඩඉම් ලකුණ හෝ කඩඉම් ලකුණට වඩා වැඩි ලකුණු ලබා ගත් සිසුන් නො සිටියේ නම් ඊට අඩු ලකුණු ලබා ගත් සිසුන් ද ලකුණු ප්‍රමුඛතාව අනුව සලකා බලනු ලැබේ.

3.9 අභියාචනා මගින් සිසුන්ට පාසල් ලබා දීමේ දී අයදුම් කර ඇති සිසුන් අතරින් පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් සංඛ්‍යාවක් සමාන ලකුණු ලබා තිබේ නම් එම සිසුන්ගේ නම් සහ තොරතුරු ඇතුළත් ලේඛනය විදුහල්පති වෙත යොමු කරනු ලැබේ. විදුහල්පති විසින් පාසල් අයදුම් කරන පළමු අවස්ථාවේ මාර්ගගත පද්ධතියට ඇතුළත් කර ඇති සිසුන්ගේ පදිංචි ස්ථානයේ ලිපිනය අනුව පාසලට ඇති ආසන්නතාව අනුපිළිවෙළින් සකස් කරන ලද එම ලේඛනය පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කළ යුතු ය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට අනුව ඇතුළත් කර ගත යුතු ශිෂ්‍ය නාම ලේඛනය අනුමත කර පාසල වෙත යොමු කරනු ලැබේ.

3.10 පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල නම් කරන ලද පෝෂිත පාසල් තිබේ නම් එම පාසල්වල සිසුන් ද, පාසල්වලට තීරණය වූ කඩඉම් ලකුණ මත පාසලට පළමු වටයෙන් යොමු කරන ලේඛනයේ සිසුන් ද, අභියාචනා මඟින් තෝරා ගත් සිසුන් ද ඇතුළත් කිරීමෙන් පසු ව පාසල්වල 6 ශ්‍රේණියේ තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් එකී පුරප්පාඩු පිරවීම සඳහා විදුහල්පති විසින් අයදුම්පත් කැඳවීම කළ යුතු ය.

3.11 පාසලට ඉදිරිපත් කෙරෙන සියලු ම අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ වර්ෂයේ 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දී සිසුන් ලබා ගත් ලකුණු අනුව පෙළ ගස්වා පුරප්පාඩු සංඛ්‍යාව ද පැහැදිලි ව සඳහන් කොට පාසලට තෝරා ගත හැකි සිසුන්ගේ නාම ලේඛනය සකස් කළ යුතු ය. එම ලේඛනය සියලුම ජාතික පාසල් සහ අදාළ වර්ෂයේ කඩඉම් ලකුණක් තීරණය වන පළාත් පාසල් මෙම අමාත්‍යාංශයේ ලේකම් ගේ ද අදාළ වර්ෂයේ කඩඉම් ලකුණක් තීරණය නොවන පළාත් පාසල් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3.12 අනුමැතියට ඉදිරිපත් කරන ලේඛනය පහත සඳහන් ආකෘතියට අනුව ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙළින් සකස් කර තිබිය යුතු ය.

පාසලේ නම :-

පුරප්පාඩු සංඛ්‍යාව :-

| අනු අංකය | විභාග අංකය | නම | ලිපිනය | ලකුණු (ප්‍රමුඛතාව අනුව) |
|---|---|---|---|---|
| | | | | |

**පාසලට ලැබී ඇති සියලු ම අයදුම්පත් ලකුණු අනුපිළිවෙළින් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.**

විදුහල්පතිගේ අත්සන ...............................

## 4.0 අනුග්‍රහ සීමාවන් යටතේ හයවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම

4.1 ප්‍රාථමික අංශයක් මෙන්ම නම් කරන ලද පෝෂිත පාසල් ද නොමැති පාසල් සඳහා පමණක් අනුග්‍රහ සීමාවන් යටතේ පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන්ට හයවන ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා 6 ශ්‍රේණියේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 15% ක පුරප්පාඩු සංඛ්‍යාවක් වෙන් කළ යුතු ය.

(අ) ආදි ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන්

(ආ) අදාළ පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන්

(ඇ) පාසල පිහිටි අධ්‍යාපන කලාපය තුළ පිහිටි පාසල් අධ්‍යාපනයට ඍජු ව ම බලපාන ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් (අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන්ට ප්‍රමුඛතාව ලැබෙන පරිදි)

4.2 එක් එක් කාණ්ඩය යටතේ හිමි වන ප්‍රතිශතයන් පහත දක්වා ඇති පරිදි විය යුතු ය.

| අනු අංකය | ගණය | ප්‍රතිශතය |
|---|---|---|
| 01. | ආදි ශිෂ්‍ය | 7.5% |
| 02. | සහෝදර | 5% |
| 03. | පාසල පිහිටි අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට ඍජුව ම බලපාන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් | 2.5% |

4.3 පස් වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් පාසල් කඩඉම් ලකුණු නිකුත් වී මසක් ඇතුළත මෙම 15% අනුග්‍රහය ලැබීමට සුදුසුකම් සහිත සිසු සිසුවියන්ගෙන් අදාළ පාසලට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් එම පාසලේ විදුහල්පති විසින් ලියාපදිංචි තැපැලෙන් කැඳවිය යුතු ය.

4.4 තම පාසලට ලැබෙන අයදුම්පත් සුදුසුකම් අනුව පරීක්ෂා කර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාව අනුව කාණ්ඩයන් සඳහා වෙන් වෙන් ව ලේඛන සකස් කර තෝරා ගත් සිසුන්ගේ ලකුණු ඇතුළත් ලේඛනය සහ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද සියලු ම සිසුන්ගේ ලකුණු ඇතුළත් ලේඛනය වෙන වෙනම විදුහල්පති විසින් මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත පිටපත් දෙකකින් එවිය යුතු ය. ඒ අනුව, නියමිත අනුග්‍රහ සීමා තුළ තෝරා ගත යුතු සිසුන්ගේ ලේඛනය අභියාචනා පළමු වටයේ සිසුන් පාසල් වෙත යොමු කිරීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් අදාළ පාසලට යොමු කරනු ඇත.

4.5 මෙම 15% අනුග්‍රහය යටතේ සිසුන් තෝරා ගැනීමේ දී අනුමත පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දෙනු නො ලැබේ. සමාන ලකුණු ලබා ගැනීම හේතුවෙන් යම් කාණ්ඩයක සුදුසුකම් ලබන සිසුන් සංඛ්‍යාව අනුමත පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවන්නේ නම් එම සිසුන්ගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවේ අනුපිළිවෙළ පදනම් කර ගනිමින් සිසුන් තෝරා ගත යුතු ය. මෙහි දී නීත්‍යානුකූල ලේඛන මඟින් පදිංචිය තහවුරු කර ගැනීමේ වගකීම විදුහල්පතිවරයා සතු වේ. ඒ අනුව, අනුමත පුරප්පාඩු සංඛ්‍යාව තුළ ඇතුළත් කර ගත හැකි සිසුන් සංඛ්‍යාව පමණක් ලේඛනයට ඇතුළත් කර විදුහල්පති විසින් පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කර අනුමැතිය ලබාගත

යුතු ය. මෙහි දී එක් ගණයකින් ඉතිරි වන පුරප්පාඩු සංඛ්‍යාව වෙනත් ගණයකින් තුලනය කිරීම සිදු නො කළ යුතු ය.

4.6 අනුග්‍රහ සීමාවන් යටතේ අයදුම් කරනු ලබන පාසල 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් කඩඉම් ලකුණක් තීරණය වන පාසලක් නම් ඉහත අනුග්‍රහයන් සඳහා ඉල්ලුම් කරනු ලබන සිසු සිසුවියන් අයදුම් කරන පාසල අයත් දිස්ත්‍රික්කයේ කඩඉම් ලකුණු සීමාව හෝ ඊට ඉහළ ලකුණු ලබමින් සුදුසුකම් ලබා තිබිය යුතු ය.

4.7 එසේ වුව ද පාසල් කඩඉම් ලකුණ නිකුත් කරන පළමු අවස්ථාවේදීම පාසල් කඩඉම් ලකුණ හා දිස්ත්‍රික් කඩඉම් ලකුණ සමාන වන අවස්ථාවල දී නියමිත අනුග්‍රහ සීමා ප්‍රතිශත වලට අදාළව පාසලේ පවතින පුරප්පාඩු සඳහා ඉහත කාණ්ඩ යටතේ අයදුම් කර ඇති දිස්ත්‍රික් කඩඉම් ලකුණට වඩා අඩු ලකුණු ලැබූ සිසු සිසුවියන් ලකුණු අනුපිළිවෙල මත සලකා බැලිය හැකි ය.

4.8 අනුග්‍රහ සීමාවන් යටතේ සිසුන් ඇතුළත් කිරීම එක් වරකදී පමණක් සිදු කරනු ලබන අතර ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම හෝ මෙම පදනම යටතේ තෝරාගත් සිසුන් පාසලට ඇතුළත් නොවීම මත ඉතිරිවන පුරප්පාඩු පාසලේ සාමාන්‍ය පුරප්පාඩු සේ සලකා ශිෂ්‍යත්වධාරීන් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

4.9 ඉහත සඳහන් කාණ්ඩ අතරින් ආදි ශිෂ්‍ය සහ සහෝදර පදනම යටතේ අයදුම් කරන අයදුම්කරුවන් අයදුම් කරන පාසලේ අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාල සීමාවක් අධ්‍යාපනය හදාරා තිබිය යුතු ය.

**5.0 පොදු කරුණු**

5.1 ආසන්න අවුරුදු 03 ක් ඇතුළත 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත කඩඉම් ලකුණු තීරණය වූ, 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම කිසිසේත් ම නො කළ යුතු ය. කඩඉම් ලකුණක් තීරණය නොවන සහ පුරප්පාඩු සහිත ජාතික හෝ පළාත් පාසල්වල 5 ශ්‍රේණිය සඳහා සිසුන්ට ඇතුළත් වීමට හැකියාව ඇති අතර ඒ සඳහා පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද ජාතික පාසලක් නම් මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ ද අනුමැතිය ලබාගත යුතු ය.

5.2 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත පාසල්වල 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීමේ දී සිංහල හෝ දෙමළ මාධ්‍ය සඳහා පමණක් සිසුන් ඇතුළත් කරනු ලැබේ. පාසලට ඇතුළුවීම සඳහා සුදුසුකමක් ලෙස ද්විභාෂා අධ්‍යාපනය ලැබීම යන හේතුව අදාළ කර නොගත යුතු ය.

5.3 රජයේ සේවකයන් පාසල පිහිටි ප්‍රදේශයට ස්ථාන මාරු ලබා පැමිණෙන අවස්ථාවන්හි දී එම නිලධරයන්ගේ දරුවන්ට 6 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු පාදක කොට පුරප්පාඩු අනුව පාසල් ලබා දෙනු ඇත. එසේ නො වන අවස්ථාවන්හි දී කඩඉම් ලකුණක් තීරණය නොවූ පුරප්පාඩු සහිත පාසල්වලට ඇතුළත් කළ හැකි ය.

5.4 විදේශයන් හි සේවය කර මෙරටට පැමිණෙන පුද්ගලයින්ගේ දරුවන් 6 ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිල්ලට ගත යුතු වේ.

i. අදාළ සිසුවා/ සිසුවිය විදෙස්ගත වීමට පෙර මෙරට පාසලක අධ්‍යාපනය ලබා තිබේ නම් එම පාසලට හෝ ඒ හා සමාන පාසලකට පුරප්පාඩු ඇත්නම් පමණක් ඇතුළත් වීමට අවස්ථාව සැලසීම.

ii. මෙරට පාසලක අධ්‍යාපනය ලබා නොමැති විටක දී අදාළ දරුවන්ගේ වයස, සාධන මට්ටම සහ භාෂා හැකියාව මෙරට රජයේ පාසල්වල 6 ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට ප්‍රමාණවත් ද යන්න අයදුම් කරන පාසල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තහවුරු කර ගැනීමෙන් අනතුරු ව එම පාසල්වල පුරප්පාඩු ඇත්නම් පමණක් ඇතුළත් කිරීමට ඉඩකඩ සලසා දීම.

5.5 ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල්වල ඉගෙනුම ලැබූ සිසුන්ගේ වසය, සාධන මට්ටම සහ භාෂා හැකියාව රජයේ පාසල්වල 6 ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට ප්‍රමාණවත් ද යන්න අයදුම් කරන පාසල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු ව තවදුරටත් පුරප්පාඩු පවතී නම් එවැනි පාසල් සඳහා ඇතුළත් වීමට අවස්ථාව සලසා දිය හැක.

5.6 5 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති ඇති පාසල්වල සියලු ම සිසුන්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ ද්විතීයික පාසල ලබා දිය යුතු ය. ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු මත ඉල්ලුම් කරන ලද පාසලක් ලැබෙන තුරු අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ එම සිසුන් අදාළ ද්විතීයික පාසලට ඇතුළත් කිරීමට සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වග බලා ගත යුතු ය.

5.7 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත කඩඉම් ලකුණක් තීරණය වන පාසලකට නම් කරන ලද පෝෂිත පාසල් ඇති අවස්ථා වලදී පෝෂිත පාසලේ අනුමත පන්ති සංඛ්‍යාව නොවෙනස් ව පවත්වා ගත යුතු ය. ශිෂ්‍යත්ව කඩඉම් ලකුණක් තීරණය වන ජාතික හෝ පළාත් පාසලකට අයත් පෝෂිත පාසලක පන්ති සංඛ්‍යාව වෙනස් කරන්නේ නම් ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ.

5.8 පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්වධාරීන් පළමු වටයෙන් හා අභියාචනා මගින් ඇතුළත් කිරීමේ දී චේතනාන්විතව පුරප්පාඩු සඟවා තබා ගැනීම සපුරා තහනම් වේ.

5.9 යම් සිසුවෙක් 6 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන කාල සීමාව තුළ දී පාසලකින් ඉවත් වී නැවත 6 ශ්‍රේණිය සඳහා එම පාසලට ම ඇතුළත් වීමට අයදුම් කරන අවස්ථාවක දී පාසලේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යා සීමාව තුළ පුරප්පාඩු පවතින්නේ නම් පමණක් පෙර ඇතුළත් වීමේ අංකය යටතේ නැවත ඇතුළත් කළ හැකි ය. එලෙස 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීමේ දී ජාතික පාසලක් නම් පාසල් කටයුතු අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය ලබා ගත යුතු ය.

5.10 1960 අංක 05 දරණ උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) අංක 1961 අංක 08 දරණ උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේදී පවරා ගන්නා අවස්ථාවේ එම පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතු ය. යම් ආගමක එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය.

5.11 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට හිමි සහනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් යොමු කරනු ලබන දිස්ත්‍රික් කඩඉම් ලකුණ හෝ එම ලකුණ ඉක්මවා ලකුණු ලබා ඇති විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ගේ ලේඛනයෙහි සිසුන් සඳහා ලබා දෙන අතර එය විශේෂ අධ්‍යාපන ශාඛාව මගින් නිකුත් කර ඇති 2020.12.03 දිනැති අංක 37/2020 චක්‍රලේඛ විධිවිධානවලට අනුව සිදු කරනු ලැබේ.

5.12 පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත දිස්ත්‍රික් කඩඉම් ලකුණ ඉක්මවූ නිවුන් දරුවන් පාසල් ඉල්ලුම් කිරීමේදී මානුෂීය හෝ වෛද්‍ය හේතූන් මත එක් පවුලක නිවුන් දරුවන් සියළු දෙනා සඳහා එක් පාසලක් ඉල්ලුම් කරන්නේ නම් එම දරුවන් සියළු දෙනාට ඇතුළු වීමට හැකියාව ඇති පාසල් කඩඉම් ලකුණක් සහ පුරප්පාඩු සහිත පාසලක් ඉල්ලුම් කල යුතු ය.

6.0 අධිකරණ තීන්දු හා අනෙකුත් නෛතික ක්‍රියාමාර්ගවලට අනුකූල ව සිසුන් ඇතුළත් කිරීමට නියම කෙරෙන අවස්ථාවන්හි දී සහ ශිෂ්‍යයාගේ අඛණ්ඩ අධ්‍යාපන අවස්ථා තහවුරු වන පරිදි අවස්ථානුකූල ව තීරණ ගැනීමේ බලය මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

7.0 සියලු ම රජයේ පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී පාසල් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පාසල් සැලසුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව පමණක් කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

8.0 මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් පිළිබඳ ව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.0 මෙම චක්‍රලේඛයේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. විගණකාධිපති
4. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්

ඇමුණුම 01

## 202… - හයවන (6) ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම

01. (i) පාසලේ නම :- ..........................................................................................
(ii) පාසලේ සංගණන අංකය :- ..........................................................................
(ii) බාලක / බාලිකා/ මිශ්‍ර යන වග :- ....................................................................
(iv) ජාතික පාසලක්ද, පළාත් පාසලක්ද යන වග :-.......................................................
(v) පාසලේ ලිපිනය :- .......................................................................................
(vi) දුරකථන අංකය :- .......................................................................................
(vii) ෆැක්ස් අංකය : - ........................................................................................
(viii) විදුහල්පතිගේ ජංගම දුරකථන අංකය :- .........................................................
(ix) විදුහල්පති සම්බන්ධ කරගත හැකි WhatsApp අංකය:..............................................
(x) පාසලේ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනය :- .........................................................

02. (i) කලාප අධ්‍යාපන කාර්යාලය හා දුරකථන අංකය :- ..................................................
(ii) දිස්ත්‍රික්කය :- .............................................................................................
(iii) පළාත :- ....................................................................................................

03. 202….(වර්ථමාන වර්ෂය) - පස්වන (5) හා හයවන (6) ශ්‍රේණිවල සමාන්තර පන්ති අනුව ශිෂ්‍ය සංඛ්‍යාව (පන්ති ගණන 08 ට වැඩි නම් මේ අනුව ආකෘතියක් සකස් කර සම්පූර්ණ කර එවන්න).

| | | සමාන්තර පන්ති අනුව ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | B | C | D | E | F | G | H | |
| 202… (වර්ථමාන වර්ෂය) - පස්වන (5) ශ්‍රේණිය | සිංහල මාධ්‍ය | | | | | | | | | |
| | දෙමළ මාධ්‍ය | | | | | | | | | |
| 202.. (වර්ථමාන වර්ෂය) - හයවන (6) ශ්‍රේණිය | සිංහල මාධ්‍ය | | | | | | | | | |
| | දෙමළ මාධ්‍ය | | | | | | | | | |
| | ද්වි භාෂා(ඉංග්‍රීසි) | | | | | | | | | |

04. ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරන පන්ති සංඛ්‍යාව..........................................................-:

202... වර්ෂය සඳහා ඔබ විදුහලේ හයවන (6) ශ්‍රේණියට අලුතින් ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව පහත සඳහන් වගුව තුළ පැහැදිලිව දක්වන්න. දැනට පස්වන (5) ශ්‍රේණියේ පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 සීමාව ඉක්මවා සිටිය ද හයවන (6) ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් සඳහා වෙන් කර ඇති පන්තිවලට ඔබ පාසලේ පස්වන (5) ශ්‍රේණිය සමත් වන, සීමාව ඉක්මවා සිටින සිසුන් තුලනය කිරීමට කටයුතු නොකළ යුතුය.

05. ශිෂ්‍ය සංඛ්‍යා පිළිබඳ විස්තර
(කරුණාකර ඔබ පාසලට අදාළ වන කොටස් පමණක් සම්පූර්ණ කරන්න)

**පන්තියක අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 45ක් ලෙස සලකා පුරප්පාඩු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.**

| 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරන ආකාරය | ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය |
| තම පාසලින් | | |
| පෝෂිත හෝ අනුබද්ධ පාසල්වලින් | | |
| අමාත්‍යාංශය මඟින් යොමු කරන ශිෂ්‍යත්වධාරීන්ගෙන් | | |
| ආදි ශිෂ්‍ය, සහෝදර, අධ්‍යයන කාර්ය මණ්ඩල ගණ යටතේ 15% අනුග්‍රහයෙන් | | |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |

| ගණය | ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය |
| ආදි ශිෂ්‍ය - 7.5% | | |
| සහෝදර - 5% | | |
| අධ්‍යයන කාර්ය මණ්ඩල - 2.5% | | |
| මුළු එකතුව | | |

- වැරදි ලෙස ඉදිරිපත් කරනු ලබන තොරතුරු සම්බන්ධයෙන් විදුහල්පතිවරයා පෞද්ගලිකව වග කිව යුතුවේ.

06. ඔබ පාසලට බලපානු ලබන සම්ප්‍රදායන් ඇත්නම් ඒ බව ලිඛිතව දක්වන්න.

.............................................................................................................................................
.............................................................................................................................................
.......................................................................................................................................

07. ඔබ පාසලට අයත් පෝෂිත/අනුබද්ධ පාසල් ඇත්නම් එම පාසල්වල විස්තර

| අනු අංකය | පාසලේ නම | ඔබ පාසලට ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

08. 06 ශ්‍රේණිය ඇතුළත් කිරීම් සම්බන්ධව හෝ පන්ති කාමර සම්බන්ධව විශේෂිත අනුමැතීන් හෝ ව්‍යුහ කමිටු තීරණ ඇත්නම් ඒ සම්බන්ධ විස්තර (ඇමුණුම් ඇත්නම් යොමු කරන්න)
.............................................................................................................................................

09. විදුහලේ පවතින නේවාසික පහසුකම් පිළිබඳ විස්තර.

- නේවාසිකාගාර ඇත / නැත
- නේවාසිකාගාර පහසුකම් ලබා දිය හැකි පිරිමි ශිෂ්‍ය සංඛ්‍යාව........
- නේවාසිකාගාර පහසුකම් ලබා දිය හැකි ගැහැණු ශිෂ්‍ය සංඛ්‍යාව ..........
- නේවාසික පහසුකම් සපයනු ලබන්නේ හයවන (06) ශ්‍රේණියේ සිට ද හත්වන (07) ශ්‍රේණියේ සිට ද යන වග -

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

විදුහල්පතිගේ අත්සන
නම
නිල මුද්‍රාව
දිනය